## රටම අද ගැස්සිලා

**ආනන්ද ගුණතිලක**
හොපර්ස් ක්‍රොසිං

ජනපති කෙනෙක් අළුතෙන් පත් කරන්නට
තිබි මැති වරණයේ ඇති හැඩ බලන්නට
කුතුහලයෙන්ම මවු බිම වෙත දුවන්නට
ආ සිතුවිල්ල බැරි උනි හිර කරන්නට

හැම චන්දෙදිම ඉතිහාසයෙ පැවැත් උන
කරමින් හෙට්ටු - ජය නැති නම් ඉවත් වෙන
සුලු ජාතික කියන කොටසට අයත් උන
පිරිසයි මෙතෙක් දිනුවේ - රට නවත් තන

'සිහළුන් තමන් ඉදිරියෙ දුණ ගස් සන්නේ'
මුස්ලිම් පිරිස් තැන තැන උඩු බුර ලන්නේ
'කොහොමද අපෙ සහය නොමැතිව රජ වෙන්නේ'
කොටි කයිවාරු ඒ ලෙසටයි හඬ දුන්නේ

හැට නව ලක්ෂයක් ජනතාවගෙ චන්ද
එක මිනිහෙකුට අර ගන්නට පුළු වන්ද
කට මැත දෙඩපු පිරිවර කරමින් අන්ද
ගෝටා රජෙකි අද - ඉතිහාසය බින්ද

උතුරෙන් රටේ පේදුරු තුඩුවේ ඉඳලා
දකුණෙන් දෙවුන්දර තුඩු කෙළවර බලලා
මුළු රට ගැස්සිලා - නින්දෙන් ඇහැ ඇරිලා
දුටුවෙමි වෙනස දුව එන හැටි පණ ගහලා

පිරිසිදු කරති රට කවුරුත් එකතු වෙලා
පාරේ නළා හඬ තරමක් අවම වෙලා
පෙර මෙන් නොවේ නීතිය දැන් එකම වෙලා
මුස්ලිම් කඩ වලත් හෙල්මට් ඉවර වෙලා

බැංකුව බිඳපු හොරු ඇතුලට දමන මෙන
පැරදුන අය නගන පැනයකි පෙරට පැන
පක්ෂයෙ තියෙන අසමගි කම සඟව ගෙන
නොකියා කියති 'අරයා' හිර කරන මෙන

නීතිය නමා කට මැත දෙඩු චරිත දෙකක්
කොටු වෙන විදිහෙ හැඩ පෙන්වන කරුණු ටිකක්
මහ ජනකාව අතරින් හඬ නැගෙන බවක්
ඇසුනා මටත් - එය රටටම මිහිරි එකක්

ඇරඹුම හරිම බලවත් - ඒකයි ඇත්ත
අමනයො සිටිති තවමත් - නොම පිලි ගත්ත
ඉවසා දරා ඔවුනගෙ ඇති අක මැත්ත
දිරි දිය යුතුය - ඒකයි අද කල යුත්ත

## නත්තලේ අරුත

**ආනන්ද ගුණතිලක**
හොපර්ස් ක්‍රොසිං

සීතල රැයෙක තරු මල් පිපි දිනෙක එදා
සලකුණු කළා මග තරුවක් රැස් විහිදා
ගව එඬෙරුන් බලා අරුමය දෑස විදා
සතුටින් ඉපිල ගියෙ දැක ,ජේසුස්, බිලිඳා

පව්කම් නිසා දුක් ගිනි මැද දැවෙන සත
මුදවා ගන්න මග හෙළි කළයුතුව ඇත
අරමුණ ඇතිව මෙලොවට එව් දෙව් දූත
ඉපදුනි නමින් පතලව ,ජේසු, දියත

නත්තල් දිනයෙ සිත්ගත් සිදුවීම මෙයයි
බයිබලයෙන් කියන තව තොරතුරු බොහොමයි
වැදගත් වෙන්නෙ කිතුදහමේ ඇති හරයයි
නත්තල් දිනයෙ ඒ ගැන සිහි ක්ළොත් අගෙයි

සාමය පෙරටු කොට නත්තල සිහි කරමු
භේදය සදහටම කවුරුත් පිටු දකිමු
දානය පරිත්‍යාගය දිරිමත් කරමු
පශ්මය හැම දෙනාටම එක ලෙස වඩමු

නත්තල අරුත ලොව හැමටම වැටහේවා
සිත්තුළ සාම සිතුවිලි මල් පිබිදේවා
මෙත්ගුණ සිසිල හැම සිත්තුළ ඉතිරේවා
නත්තල් සාමයෙන් මුළුලොව සැනසේවා

## පුංචි පුතා ඇවිල්ලා

**ජී.ජී. ජයරත්න**
හන්ටික්ලබ් විලේජ් - ක්‍රැන්බරින් ඊස්ට්

ලා දළු නැගී ගස් වැල් වල දිගන්තය
මල්ගොමු සුවඳවත් කරවයි දස්නතය
දැනෙනා සතුට සැම සිත් වල අනන්තය
පොඩිපුතු සැපත් වී සමඟින් වසන්තය

මොළකැටි දෙඅත්, පා හෙමිහිට සැලෙන සොබා
ආසයි බලන්නට දෙනෙතින් හැගෙන පබා
සුව යහනකට වී හිඳ හිඳී සුවය ලබා
සුරකුමරියන් හා හිනැහී මල්ලි බබා

අම්මගෙ තුරුල්ලට වී අයියාට හොරා
වෙහෙසී නැතත් නිදියයි ඇහැරවන තුරා
මව් සෙනෙහස මුසුව දෙන කිරි බිඳුව උරා
ආයෙත් සුවඳ විහිදෙයි මුළු ගෙදර පුරා

දුහුවිලි ගා ගනී හොදහැටි බිම පෙල්ලී
කෑ කෝ හඬට යයි මුළු ගෙදරම හෙල්ලී
දුව පැන නට නටා අයියලේ අත එල්ලී
දඟකම් කරන හැටි පෙන්වයි පොඩි මල්ලී

හුරතල් වෙමින් ලැබගෙන කාගෙත් ආලේ
පොඩි පුතු අපේ ගෙවනා සුන්දර බාලේ
උගෙනා සිප් සතර ඔබ ලොකු වෙන කාලේ
අයියා කියා දෙයි ලොව දිනනා තාලේ

අම්මට තාත්තට කීකරු පුතෙකු වෙගේ
තනි නොතනියට අයියගෙ හෙවනැල්ල වගේ
යහ ගුණ දම් සපිරි දිරි වන්තයෙකු වගේ
හිටියොත් ඔබට සලකයි ලෝකයම වගෙ

## ඇලක් ලග අසිරිය

**බණ්ඩාර කේ.**
වන්ටිර්න දකුන

කොල පාට දලු රිකිලි අග දිළෙන ජල බිංදු
හිරු කුමරි එබෙන හැටි නොකියාම ගී සිංදු
ගලා නොගලා රැදුනු නිල් ජලයෙ නෙත රැංදු
තිත්ත පැටියෙක් හෙව්ව පිළිහුඩුව නෑ රංඩු

කර කසක ඉඩෝරෙට පොලව උඩ ඉරි අදින
සැර නගා හබා විත් වියලි සුළගක එතෙන
මර බියෙන් අතු සලන ජලය නෑ මුල් හොයන
දර වගේ මියැද්දන ගස් කොලං පන අදින

උණ සෙවනෙ පත් සැලී සිසිල පා කර හරියි
උල්පතක මහිමයට ගලන ඇල දොල හැඩයි
වන පියට බැදුනු පෙම නැවුම් ආදරෙ වගෙයි
ජීව නාලියෙ සතුට නෙත ගතට පන පුදයි

වියලි ගම් බිම් නිසරු ඉඩෝරෙට අතවනයි
දැවෙන මං මාවත්ද අසහනයෙ පල දරයි
වැටෙන විට එක එකා හුස්මකට දේ නැතෙයි
දුමට යට උන පසුව සිසිලසක තෙත සොයයි

වනසන්න එපා මේ ලොවේ ලස්සන බලමු
සැනසෙන්න ඉඩදෙන්න දරුවන්ට එය තියමු
ලතැවෙන්න දවසකදි ඉඩ නොතිය දැන් ඉදිමු
වියලෙන්න ඉඩ නොදී අපේ රට රැක ගනිමු

## කූඹි සහ මැඬි

**සු.ගා. පුංචිහේවා**
මෙල්බන් නුවර සිට

යුරොක් පංසල ඇතුලේ
බෝ සෙවනේ බෝ ගස යට
පොඩි පුතු ඉඳ කූමියන්ව
අඹරා මරා දමද්දී,

එය දුටු සැන මව් තුමී
සැර වැර වී එපා කියලා
"පංසල් ඇවිදින් ඇයිදෝ
සතුන් මරන්නේ ඇසුවේ"

ලැජ්ජාවෙන් මදෙස බැලු
පොඩි පුතුගෙන් මා ඇසුවා
පාසැල් යනවද පුතුනේ
සිහළ බසත් දන්නවාද

අම්මා මට පිළිතුරු දුනි,
"ගෙදරදි සිංහලෙන් කථා
අපි නුගන්නා කවුරුද
උගන්වන්නේ සිංහල බස"

ලොව අතැඹුල සේ දනිතියි
සිතනා සිරිලක උගතුන්
අපේ කමට ගරහද්දී
ළිං මැඩියන් යැයි කියද්දි

ඇසුණි නම් මෙල්බන් මැඬි
උන්ගේ බසින් බක බක ගා
සිනහ වෙවී සිනහ වෙවී
බඩ පිම්බුණු උගතුන් දැක

## හෙණ වැදිලද

**සු.ගා. පුංචිහේවා**
මෙල්බන් නුවර සිට

කැන්ගරුවන් සිටින රටෙහි
මෙල්බන් උත්සව මැඳුරේ
නෙයෙක් රටින් පැමිණි දනා
විසිරි සිටින දන අතරේ

සිරිලකදී නොහඳුනමුත්
විදෙස් රටක හමුවුයෙන්
අපේකමට බැදි හදකින්
මුව පුරවා සිනහ වුවත්

පිට සක්වළකින් වාගේ
අප දුටු සැන ඉවත බලා
ඈත් වෙලා යන්න ගියේ
අපේ කමට හෙණ වැදිලද



## යාල සැරසූ නන්දිමිත්‍ර සිරගත වේ

**ජයසේන කොඩිතුවක්කු** වත්තල

යාල මගේ සෙනෙහස වපුරපු කැළය
ආල වුනේ හැමටම ආ එක ලෙසය
කාල මොකුත් මම හිටියේ සතුටින් ය
දාල යන්නෙ කොහොමද මගෙ නිජබිමය

තේජස මගේ පෙන්වා හැම දෙනට නිතින්
තැබුවේ ගෞරවය මව්බිම ඉවසීමෙන්
වරදක් වුනත් නොදනිද ඔබ මම තිරිසන්
නපුරැද අනේ මේ තරමට අද මිනිසුන්

නුහුරැයි සිර ගෙදර ඇස කඳුලකි හෙළුවේ
ගහ කොල නැතිව මොන සැපතද සිත දුක්වේ
කරුමෙද මගේ පෙර බවයෙක බල පෑවේ
ඉවසා සිටිමි සිත නැහැ වෛරය කෙරුවේ

## මනසින් දකිමි එදා

**ජයසේන කොඩිතුවක්කු**
වත්තල

අම්මා වේදනා ගුලි කර විඳින්නැතී
තාත්තා නිහඬවම දොර ළඟඉන්න ඇතී
දෙන්නගෙ පිනට මම අම්මට ලැබෙන්නැතී
දෙන්නම සිනාසී මම සිප ගන්න ඇතී

උපන් දිනය සමරන්නේ මම මෙහෙමයි
උතුම් දෙමව්පිය ගුණකඳ සිහිකරලයි
ඔවුන් විඳපු දහදුක මනසින් දැකලයි
නිවන් සුව පතා ඔවුනට පින් දීලයි

